පුවත් වාර්තාවක් තුළ පුවත් වාර්තාවට අදාළ නොවන මොහොතක පුද්ගලයෙකුගේ බාහිර ස්වරූපය ඉස්මතු කොට දැක්වීම කෙතරම් ආචාර ධර්මානුකූලද යන්න මීන් පෙරද අපි සංවාදයට ගෙන ඇත්තෙමු. කාන්තාවක සම්බන්ධයෙන් "රූමත්" වැනි විශේෂණ යොදාගැනීම්ද අයත් වන්නේ මෙම බාහිර රූපය ඉස්මතු කොට දැක්වීමටම වන අතර, බොහෝ විට මාධ්‍ය තුළ ඉස්මතු කෙරෙනු දැකිය හැක්කේද කාන්තා බාහිර රූපයයි.

මෙය පැහැදිලි කරගැනීම සඳහා ඝාතනයක් යැයි පැවසෙන සිදුවීමක් පුවත්පත් දෙකක් මගින් වාර්තා කර ඇති අයුරු නිරීක්ෂණය කරමු. ලංකාදීප පුවත්පතෙහි (02/17) සඳහන් වන්නේ "රූමතියක" යොදාගනිමින් ව්‍යාපාරිකයා ඝාතනය කර ඇති බවයි. එම පුවත තුළ දිගින් දිගටම එම කාන්තාව පිළිබඳව සඳහන් වන්නේ "රූමතිය" යන යෙදුමෙනි. කෙසේ වෙතත් එම පුවතම ආවරණය කරනා මව්බිම පුවත්පතේ (02/17) එම කාන්තාවගේ බාහිර පෙනුම පිළිබඳ කිසිදු සඳහනකින් තොරව පුවත ඉදිරිපත් වී ඇත.

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #Lankadeepa